පරිසර සම්පත් පැතිකඩ

590A මාගම්මන බටහිර

01. මූලික තොරතුරු.

මාගම්මන බටහිර 590 A
වසමේ වපසරිය

	මුළු වපසරිය
වර්ග කිලෝමීටර්	**1.27**
අක්කර	**313.82**
හෙක්ටයාර්	**127**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය -හෝමාගම
ගොවිජන හා කෘ.ප.නි.ස කොට්ඨාසය - කහතුඩුව/මාගම්මන
සෞ.වෛ.නි. කොට්ඨාසය -කහතුඩුව
පශු වෛද්‍ය නිලධාරි කා.කොට්ඨාසය -හෝමාගම
බීට්ටු වන නිලධාරි කාර්යාල කොට්ඨාසය -කළුතර
අඩවි වන නිලධාරි කාර්යාල කොට්ඨාසය - වග
වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසය - කොළඹ

ජනගහණය - මුළු ජනගහනය 3014
-ස්ත්‍රී 1601
-පුරුෂ 1430

(*උපුටා ගැනීම 2024- සම්පත් පැතිකඩ*)

ජනාවාස කරණයේ ස්වභාවය - අර්ධ නාගරික

දේශගුණික තොරතුරු

- උතුරු අක්ෂාංශ - 6.9122
- නැගෙනහිර දේශාංශ - 79.9687

උෂ්ණත්වය

- සාමාන්‍ය **30.68 C**
- උපරිමය **32 C**
- අවමය **29.8 C**

වර්ෂාපතනය **390mm**





සාපේක්ෂ ආර්ද්‍රතාවය - **33%** පමණ

පාංශු තොරතුරු

- පසේ ස්වභාවය - වැලි සහිත ලෝම පස
- පසේ වර්ගය - රතු කහ පොඩ්සොලික්
- සුලබ පාෂාණ ස්ථිත්වය - ග්‍රැනයිට්

2. පරිසර සම්පත් පැතිකඩක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවය.

- සම්පත් පිළිබඳ සමාලෝචනය කිරීම
- තිරසර සම්පත් භාවිතාව හා කළමණාකරණය කිරීම
- පාරිසරික ගැටළු හඳුනාගැනීම හා ඒවාට විසඳුම් යෝජනා කිරීම.
- පරිසර කළමණාකරණයෙහිලා ප්‍රජාවේ දායකත්වය, සහභාගීත්වය හා අවබෝධය පුළුල්කිරීම.
- සංවර්ධන යෝජනා හඳුනාගැනීම හා පරිසර ශක්‍යතා සමගාමී කිරීම.
- ආපදා අවදානම් හඳුනාගැනීම හා බලපෑම් අවම කර ගැනීම.
- අඛණ්ඩ මෙහෙයුම් කරණය , අධීක්ෂණය හා ඇගයීම ස්ථාපිත කිරීම

3. ස්වභාවික සම්පත් පැතිකඩ

I. භෞමික සම්පත්

a) වපසරිය / භූමි ප්‍රමාණය

	මුළු වපසරිය
වර්ග කිලෝමීටර්	1.27
අක්කර	313.82
හෙක්ටයාර්	127

b) භූමි පරිහරණ සැලැසුම

කෘෂිකාර්මික කටයුතු සඳහා භූමි පරිහරණය

i. වී - හෙක්ටයාර් 23.87
ii. වෙනත් ධාන්‍ය බෝග - වාර්ථා වී නොමැත
iii. අපනයන කෘෂි බෝග -වාර්ථා වී නොමැතෙ
iv. භූමි යෙදවුම

භූමියේ ස්වභාවය	ප්‍රමාණය	ශ්‍රේණිය
ගොඩ ඉඩම්	අක්කර 243	
මඩ ඉඩම්	අක්කර 35.3	ඒ
පුරන් වූ	27.99	බී
අත්හැරදැමූ (පුරන්හැල්)	38.96	සී

c)පසේ ස්වභාවය හා සාඵල්‍යතාවය -වැලි සහ බොරළු ලෝමපස
d)පාංශුබාදනයේ ස්වභාවය - වාර්ථා වී නැත
e)පාංශු හායනයේ ස්වභාවය - වාර්ථා වී නැත

II. ජලජ සම්පත්

a)මතුපිට ජල මූලාශ්‍ර

ගංගා	නැත
අතු ගංගා	නැත
ඇල මාර්ග	හීන් ඇළ
වැව් /තටාක	නැත
පොකුණු /නිර්මිත පොකුණු	නැත
දිය උල්පත්	නැත

b)භූගත ජලය

ළිං	නළ ළිං	පොදු ළිං
240	0	01

c) වර්ෂාපතනය

වාර්ෂික මධ්‍යන්‍ය වර්ෂාපතනය

<u>වර්ෂා ක්‍රමය</u>	<u>වැසි ලැබෙන කාල සීමාව</u>
පළමුවන අන්තර් මෝසම් වැසි	මාර්තු /අප්‍රේල්
නිරිතදිග මෝසම් වැසි	මැයි / සැප්තැම්බර්
දෙවන අන්තර් මෝසම් වැසි	ඔක්තොම්බර් / නොවැම්බර්

වාරිමාර්ග කටයුතු

- මහා වාරි ව්‍යාපාර - වසමේ නැත
- සුළු වාරි ව්‍යාපාර - වසමේ නැත

ජලයේ ගුණාත්මක බව - pH 6.5 - 7.5

ජල සුලබතාවය

මෙම වසම භූගත ජල සම්පතට උරුමකම් කියන වසමකි . එසේ වුවත් ජල සම්පාදන මණ්ඩලයේ ජල පහසුකම් වසමේ ගෘහ ඒකක වලින් 58% පමණ ලබාගෙන ඇත. එමෙන්ම මාගම්මන නැගෙනහිර වසම මූලික කර ගනිමින් ක්‍රියාත්මක වන ප්‍රජා ජල සැපයුමද වසමේ ගෘහ ඒකකවලින් 15% පමණ භාවිතයට ගනී.

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ 2024

iii.වනාන්තර හා වන වගාව

a)වන වැස්මේ වපසරිය - අදාල නොවේ

b) සුලබ ශාක

ශාක වර්ගය	ප්‍රමාණය
කොස්	1250
දෙල්	100
අඹ	550
රඹුටන්	460
වෙරළු	300
පේර	600
පොල්	1700
කෙසෙල්	1750
නාරන්	250
ගස්ලබු	600
බෙලි	26

මූලාශ්‍රය: 202/2023 food gate වැඩසටහන

සුලබ ශාක



c) දැවමය නොවන වන නිශ්පාදන

ආහාර හා ආකලන	දේශීය ඖෂධ	ශාක සාර	අත්කම් අමුද්‍රව්‍ය	ඉදිකිරීම් අමුද්‍රව්‍ය	සැරසිලි හා සංස්කෘතික වටිනාකම් සහිත
ඉඟුරු	ඉඟුරු	රබර්	උණබට	පොල්	හාතවාරිය
කහ	අමු කහ	කෝමාරිකා	පෝටාවැල්	පුවක්	විසිතුරු මල්
සේර	කෝමාරිකා		මඩු ගස්	කිතුල්	විසිතුරු ශාක පත්‍ර
ගම්මිරිස්	නික		වැටකෙයියා	උණ	පොල්
කුරුඳු	පාවට්ටා			යකඩමරන්	මඩුගස්
පොල්	කරපිංචා			රබර්	
මිරිස්	පිටවක්කා			තේක්ක	
රම්පෙ	හාතවාරිය				
	යකිනාරන්				
	කොහොඹ				
	කුප්පමේනියා				
	ගොටුකොළ				

වන විනාශ කිරීම් පිළිබඳ විස්තර - වාර්තා නොවේ
වන වගා ව්‍යාපෘති - වාර්තා නොවේ
වන සංරක්ෂණ ප්‍රයත්නයන් - විස්තර සඳහන් නොවේ
ප්‍රජා වැඩසටහන් - රුක්රෝපණ වැඩසටහන් කාලීනව සිදුවේ

- ජෛව විවිධත්වය

ශාක ලේඛනය

ශාක වර්ගීකරණය
(දේශීය /ඒක දේශීය /හඳුන්වා දුන් විදේශීය හෝ දේශීය/ස්වභාවිකෘත විදේශීය හෝ දේශීය /ආගන්තුක/ආගන්තුක ආක්‍රමණශීලි)

දේශීය ශාක	ඒක දේශීය	හඳුන්වාදුන් විදේශීය/දේශිය	ආගන්තුක හා ආක්‍රමණික ශාක	ආක්‍රමණික ශාක
කුඹුක්	හීන් බෝවිටියා	ඇකේශියා	ගඳපාන	නැත
මී	හල්	කහ කරඳ	ජපන් ජබර	
තේක්ක	ගොඩපර	ක්‍රිස්ටිනා	හවරිනුග (යකඩමරන්)	
මහෝගනී		රට පුවක්	වයිඩේලියා	
රුක් අත්තන		පීනට් බටර් ෆෲට්		
සිංහල දෙල්				
නැදුන්				

දේශීය ශාක

මෙම ශාක දේශීය වශයෙන් පැවතියද වසම තුළ බහුලව දැකිය හැකි ශාක නොවේ. දැවමය වටිනාකම් හා පාරිසරික වටිනාකම් හේතුවෙන් ප්‍රදේශයට හඳුන්වා දුන් ශාක වේ.

හඳුන්වා දුන් විදේශීය ශාක

විසිතුරු පැලෑටි ලෙස මෙන්ම විවිධ අවශ්‍යතා සඳහා විදේශයන්ගෙන් හඳුන්වා දුන් ශාක වේ . කෙසේ වුවද මෙම විසිතුරු පැලෑටි වර්ග බහුල ලෙස නිවාස අලංකරණය සඳහා භාවිතා කරනු දක්නට ලැබේ.

ආගන්තුක ශාක/ ආක්‍රමණශීලී ශාක

c)අන්තරායට ලක්වූ කාණ්ඩ - වාර්ථා නොවේ

04 .පරිසරය හා සම්බන්ධ මානව ක්‍රියාකාරකම්

1. කෘෂිකර්මය

වසමේ සම්පත් සිතියම



a)ප්‍රධාන භෝග

මෙම වසමේ ප්‍රධාන භෝගය ලෙස තවමත් හඳුනාගත හැක්කේ වී වගාවයි. වසමේ මුළු වපසරියෙන් 22% (අක්කර71) ක් පමණ මඩ ඉඩම් ලෙස හඳුනාගෙන ඇතත් මේ වන විට වී වගාව සිදුකරනු ලබන්නේ එයින්ද 50% (අක්කර 35.03) පමණ භූමි ප්‍රෙද්ශයක පමණි. ගොවීන් 40 ක් පමණ වී වගාවේ යෙදී සිටියි. බහුතරයක් වී වගා කරනු ලබන්නේ තම පෞද්ගලික පරිභරණය සඳහාය.

b)අතිරේක භෝග

වසම තුළ අතිරේක භෝග වගාව සිදුවන්නේ ඉතා අවම මට්ටමිනි. විශේෂයෙන්ම මහා පරිමාණ වගාවන් වසම තුළ සිදු නොවුනත් තම ගෙවත්ත තුළින් අතිරේක ආදායම් මාර්ගයක් ලෙස වාණිජ වගාවේ යෙදෙන ගොවි පවුල් සීමිත ප්‍රමාණයක් වසම තුළ දක්නට ලැබේ. බොහෝ දුරට බටු ,මිරිස්,දඹල,කරවිල, මෑ, වැනි ආහාර භෝග ත් කිරි අල,මඤ්ඤොක්කා,හිඟුරල, දන්දිල, බතල වැනි අල වර්ගත් වගා කරනු ලබයි.එසේම විවිධ පළා වර්ග ද මේ අතර වෙයි. අත්හැර දැමූ කුඹුරු ඉඩම් (පුරන්)මෙම වගාවන් සඳහා යොදාගන්නා ගොවි පවුල් කීපයක්ද වසම තුළ දක්නට ඇ ැත.මුළු ගම්මානය තුළම අක්කර 03ක පමණ භූමියක් මෙම අතිරේක භෝග වගාවන් සඳහා යොදා ගනු දැකිය හැක.

c)අපනයන භෝග

අපනයන භෝග ලෙස හඳුනාගත් රබර් සහ පොල් වසම තුළ ඉතා සුළු වශයෙන් දක්නට ලැබේ . එහෙත් තේ වගාව මාගම්මන බටහිර වසමේ දක්නට නොලැබේ. අක්කර 8ක පමණ භූමි ප්රමාණයක් පොල් වගාකර ඇති අතර පොදුවේ වසම පුරාවටම ගෙවතු වල තම පෞද්ගලික පරිභෝජනය සඳහා ගස් කිහිපයක් හෝ පොල් වගාකර තිබීම දක්නට ලැබේ. අතීතයේදී ඉතා විශාල වශයෙන් රබර් වගාව වසම තුළ සිදු වුවද දැනට දක්නට ලැබෙන්නේ එම වගාවන්ගෙන් ශේෂ වූ අක්කර 2.5 පමණ රබර් වගාවකි . එයද ආදායම් උත්පාදනය සඳහා යොදා ගැන ෙන්නේ අවම වශයෙනි.

d)සුළු අපනයන භෝග

මෙම වසම තුළ කුරුඳු, ගම්මිරිස්, ඉඟුරු, කහ ආදිය සුළු අපනයන භෝග ලෙස හඳුනාගත හැකි වුවද මහා පරිමාණයෙන් සිදුවන වාණිජ වගාවන් ලෙස හඳුනාදිය නොහැක. බොහෝදුරට සිදු වනුයේ තම පෞද්ගලික පරිභෝජනය සඳහා කුළු බඩු ලෙස තම ගෙවත්ත තුළ මෙම භෝග සුළු වශයෙන් වගා කර ගැනීමයි

බෝග වර්ගය	අක්කර ප්‍රමාණය
කුරුඳු	අක්කර 1.5
ගම්මිරිස්	අක්කර 2
බුලත්	අක්කර 0.75
ඉඟුරු	අක්කර 0.60
කහ	අක්කර 0.40
කෝපි/කොකෝවා/ගොරකා/පුවක්	වගාවක් ලෙස දක්නට නොමැත



e)වෙනත් වාණිජ භෝග - මෙවැනි භෝග වසම තුළ වාර්ථා වී නොමැත.

f)රසායනික පොහොර යෙදවුම



වසම තුළ ප්‍රධාන වශයෙන් සිදුවන්නේ වී වගාව වන අතර පොල් වගාවද යම් තරමකින් සිදු කරනු ලබයි. මේ සියළු වගාවන් සඳහා මේ වනවිට භාවිතයට ගැනෙන්නේ රසායනික පොහොර වේ.

g)කෘමි පළිබෝධ නාශක යෙදවුම.
වී වගාව මෙන්ම පොල් වගාව සම්බන්ධයෙන්ද පළිබෝධනාශක යෙදිය යුතුව ඇත.

h)සාම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත්
මේ වන විට සාම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත් අභාවයට ගොස් නවීන ක්‍රමවේද භාවිතයට පැමිණ තිබේ. වී ගොවිතැන් කිරීමේදී මේ වන විට සියළු කටයුතු මැෂින් මගින් සිදු කරනු දක්නට ලැබේ.

i)නවීන කෘෂිකාර්මික පිළිවෙත්
- බිම් සැකසීම හා පස බුරුල කිරීම සඳහා පෙර පැවති නගුල හා මැඩවීමේ ක්‍රමය වෙනුවට ට්‍රැක්ටර් යොදාගැනීම.
- අසුවනු නෙලීම හා ගොයම් පෑගීම සඳහා යන්ත්‍ර භාවිතය.
- රසායනික පොහොර භාවිතය, වල්නාශක හා කෘමි නාශක යෙදීම.

j)යහපත් කෂිකාර්මික පිළිවෙත්. (GAP) - මෙම සහතිකය ලබාගත් ගොවීන් වසම තුළ නැත.

k)කෘෂිකර්මාන්තය කෙරෙහි වන අභියෝග හා දුෂ්කරතා

අර්ධ නාගරීකරණයට ලක්වූ මෙම වසම අතීතයේ කෘෂිකර්මාන්තය ඉතා හොඳින් සිදුකර ඇත. . අක්කර 71 ක් පමණ වූ මඩ ඉඩම් ඉහල වී අස්වැන්නකට හිමිකම් කියා ඇත.මේ වන විට එම කුඹුරු වගා කරන ප්‍රමාණය අක්කර 35 දක්වා පහත වැටී ඇත.

එසේම පොල් /රබර් ආදී අපනයන භෝග ද, සුළු අපනයන භෝග, එළවළු වර්ග පළතුරු වර්ග ආදිය සශ්‍රීක ලෙස දක්නට ලැබී ඇත. කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයක් වන හෝමාගම ට ඉතා ආසන්න මෙන්ම නිස්කලංක වටපිටාවක් ග්‍රාමීය ස්භාවයක වද හිමිකම් කී මාගම්මන ගම කාර්යබහුල ජනතාවට වටිනා නවාතැනක් විය. ඉතා ඉක්මනින් වගා බිම් මෙන්ම විශාල ඉඩම් කුඩා කොටස් වලට කඩා වෙන්දේසි කිරීම වැනි මිනිස් ක්‍රියාකාරකම් තුළින් වසමේ පැවති කෘෂිකර්මාන්තය අභාවයට ගොස් ඇත.

පාරම්පරික ගොවීන් ගේ වර්ථමාන පරම්පරාවන් ගොවිතැන අත්හැරීම මෙන්ම අධ්‍යාපන මට්ටම ඉහල යාමෙන් දරුවන් රැකියාගත වීම, පුද්ගල සංකීර්ණ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ගොවිතැන තුළින්

ඉහළ ආදායමක් ලබාගැනීමට නොහැකි වීම ත් ගම ආසන්නයේම කර්මාන්ත පුරයක් බිහිවීම මගින් ඉක්මන් ආදායම් ඉපයීම උදෙසා රැකියාගත වීමට ලැබුන විවෘත්ත අවස්ථා ආදී හේතුන් නිසා කෘෂිකර්මාන්තය අභියෝගයට ලක්විය. වගාකිරීමට කාලය ශ්‍රමය ධනය නොමැති වීමහේතුවෙන් කුඹුරු පුරන් වීම ,කාලගුණික දේශගුණික වෙනස්වීම් සමඟ අස්වැන්න අඩුවීමෙන් ද කලින් කලට පැමිණෙන පළිබෝධ උවදුරු හේතුවෙන් ද ගොවීන් අධෛරයට පත්වීම මගින්ද කෘෂි කර්මාන්තය පසුබෑමට ලක්වී ඇත.

වගා ගෘහ තුළ නවීන ක්‍රමවේද භාවිතා කරමින් වගා කිරීමට සකස්කළ ගොවිබිමක් වසම තුළ දක්නට ලැබේ. මහල් තුනකින් යුක්ත වගා ගෘහයක් භාවිතා කරමින් සිදු කරනු ලැබූ වාණිජ ගර්කින් වගාවකින් පසුව මේ වන විට වගා කටයුතු අත්හැර දමා ඇත.මෙම වගා බිමෙහි පොහොර නිශ්පාදනය , පොල්ලෙලි කැබලි කිරීමේ යන්ත්‍ර, කුකුළ් පාලනය,පොල්තෙල් නිශ්පාදනය, හයිඩ්‍රොපොනික්ස් ක්‍රමවේදයට වගාකිරීමට සකස්කළ වගා ගෘහයක්ද ඉදිකර ඇත. විවිධ ගැටළු හේතුවෙන් මෙම වගා බිම අභාවයට යමින් පවතී.

ii.පශු කර්මාන්තය

	ප්‍රමාණය	සත්ත්ව වර්ගය	යොදාන්නා කාර්යය	හිමිකරුවන් ගණන	ඇති කිරීමේ ක්‍රමය
එළ ගව	22	සහිවාල්	කිරි	04	නිදැලි
මීගව	31	දේශීය මීගවයින්	කිරි	03	නිදැලි
කුකුළු	160		බිත්තර	03	නිදැලි
වෙනත් (තිරික්කල් තරඟ සඳහා යොදාගන්නා ගවයින්)	02		වෙනත්	01	අඩසියුම් ක්‍රමය

b)පශු කර්මාන්තය සඳහා යොදාගන්නා ආහාර

ස්වභාවික ආහාර මෙන්ම කෘතිම මිශ්‍ර ආහාර වර්ගද සතුන් ට ලබාදීම හිමිකරුවන් විසින් සිදුකරනු ලබයි.

සතුන්	ලබාදෙන ආහාර වර්ග	ලෙඩරෝග
එළ ගව	අමුතෘණ/පිදුරු/පුන්නක්කු	නැත
මීගව	අමුතෘණ/පිදුරු/පුන්නක්කු	නැත
කුකුළු	හාල් නිවුඩු /ගැට කොළ/	නැත

c)පශු වෛද්‍යමය සාධක

සතුන් සම්බන්ධව රෝග වාර්ථා නොවූ බව හිමිකරුවන් ගෙන් කළ විමසීමේදී සඳහන් විය.

iii)ධීවර කර්මාන්තය

අදාල නොවේ.

iv)ශක්ති ප්‍රභව

a)ප්‍රධාන ශක්ති ප්‍රභව වර්ගීකරණය

ශක්ති ප්‍රභවය	භාවිතා කරන පවුල් ගණන
විදුලිය	813
සූර්ය බලය	05
ගෑස්	640
පෙට්‍රල්/ඩීසල්	795
දර	250



- **පුනර්ජනනීය ශක්ති ප්‍රභව**

.

ශ්‍රීලංකාවේ භූගෝලීය පිහිටීම අනුව සුළං හා සූර්ය බලය ඉතා ඉහල ධාරිතාවයකින් ලබාගැනීමේ හැකියාව ඇත.මෙමගින් පරිසරයට සිදුවන හානිය ඉතාමත් අවමය. ගෝලීය උශ්ණත්වය ඉහල යාමේ අවධානම ද පාලනය වේ.
කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම වැනි නාගරීකරණය වූ පරිසරයක සුළං බලයෙන් විදුලිය නිපදවීම ප්‍රායෝගික නොවන බැවින් මෙම ප්‍රදේශය වඩාත් සුදුසු වන්නේ සූර්ය බලය මගින් බලශක්තිය නිපදවීමයි.

- **පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව**

මේ වන විට අප විසින් භාවිතා කරනු ලබන ෆොසිල ඉන්ධන පුනර්ජනනීය නොවන බලශක්තීන් සඳහා දිය හැකි හොඳම පිළිතුරයි. ගල් අඟුරු ,තෙල්, ගෑස් වලින් ෆොසිල ඉන්ධන සමන්විත වේ . පොළව අභ්‍යන්තරයෙන් ලබාගන්නා මෙම ෆොසිල ඉන්ධන වසර මිලියන ගණනකට පෙර පොළොව මත මිහිදන් වූ ශාක හා සත්ත්ව කොටස් වල අවශේෂයන් වේ. දිගින් දිගටම මෙම බලශක්තීන් භාවිතා කිරීම තුළින් ක්ෂය වීමට ලක් වේ. මෙම ප්‍රභවයන් සීමා සහිත වේ . එසේම මෙම ෆොසිල ඉන්ධන දහනය තුළින් වායුගෝලයට නිකුත්වන කාබන්ඩයොක්සයිඩ් ඇතුළු වායු මගින් දේශගුණික විපර්යාස හා වායු දූෂණයට සැලකිය යුතු දායකත්වයක් සපයනු ලබයි.
මෙම බලශක්තීන් වල අහිතකර පාරිසරික හා සෞඛ්‍යමය බලපෑම් මෙන්ම සම්පත් වල සීමිත භාවයත් පුනර්ජනනීය හා තිරසර බලශක්තීන් වෙත යොමු වීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි.

b)ස්වභාවික ශක්ති සම්පත් කෙරෙහි වන ඉල්ලුම හා සැපයුම.

අප ග්‍රාම නිළධාරි වසම තුළ ප්‍රධාන වශයෙන් භාවිතාවන බලශක්ති ප්‍රභවයන් වනුයේ විදුලිය හා ඉන්ධනයි. විදුලි බිල ඉහල යාම මෙන්ම ඉන්ධන මිල දිනෙන් දින ඉහල යාම මධ්‍ය ආදායම් මට්ටමේ පසුවන ජනතාවට ආර්ථිකමය වශයෙන් බලපෑම් එල්ල කරනු ලබයි. මෙම පුනර්ජනනීය නොවන දිනෙන් දින ඉහල යනු ලබන අධික මිලගණන් වලින් යුක්ත බලශක්ති භාවිතයෙන් ඉවත්වී පුනර්ජනනීය බලශක්තීන් වෙත යොමු වීම බහුතරයකගේ කැමැත්ත ඇතත් එසේ නොවීමට ඒ සඳහා වන මූලික පිරිවැය මෙන්ම ආයතනික වශයෙන් ඇතිවන ගැටළු, නඩත්තු කිරීමේ තාක්ෂණික ගැටළු හේතුවෙන් සිදුවන අපහසුතා බලපා ඇත.
එමෙන්ම ගෘහස්ථ වශයෙන් බයෝ ගෑස් නිපදවීමද අධික පිරිවැය හේතුවෙන් මගහැරී ඇත.



d) පුනර්ජනනීය ශක්ති ප්‍රභව යෙදවුම් සඳහා ප්‍රජාවගේ දායකත්වය.

මෙම වසම තුළ මේ වන විටත් භාවිතයට ගැනෙන්නේ විදුලිබලයයි. පුන්ර්ජනනීය බල ශක්ති කෙරෙහි පවතින අවධානය අවම මට්ටමක පවතී. වසම තුළ ස්ථාපිත සූර්ය පැනල සංඛ්‍යාව 05 කි. මේ සම්බන්ධව පුද්ගල දැනුවත් භාවය ඇති නමුත් ඒ් සඳහා වැය වන මූලික පිරිවැය අධික වීම , තාක්ෂණික ගැටළු ආදිය නිසාවෙන් යම් පසුබෑමක් ඇතිවී තිබේ.

05.සමාජ සංස්කෘතික සන්දර්භය-

i)පරිසර ගැටළු පිළිබඳ ප්‍රජාවගේ අවබෝධය හා විසඳුම් යෝජනාකරණ යන්ත්‍රය.

මාගම්මන බටහිර වසම තුළ පාරසරික ගැටළු සම්බන්ධව ප්‍රජාව තුළ යම්කිසි මට්ටමක අවබෝධයක් ඇතත් සුළුතරයක් පරිසරය පිළිබඳ දැනුවත් භාවයෙන් තොරව කටයුතු කරනු දක්නට ලැබෙයි. හෝමාගම ප්‍රාදේශීය සභාවේ කසල එකතු කිරීමේ ලොරි රථය වසමේ ප්‍රධාන මාර්ග දෙක ආවරණය කළත් අතුරු මාර්ගවල කැලිකසල මෙන්ම නිවාස වලින් බැහැර කරන අනෙතුත් අපද්‍රව්‍යද ඇතැම් විට මාර්ගයට මෙන්ම හිස් ඉඩම් වලට බැහැර කරන අවස්ථා දක්නට ලැබේ .

මාගම්මන දොළේකඩේ සිට නියදගල දෙසට දිවෙන මාර්ගයේ වෙල්යාය ප්‍රදේශය මෙම කැළිකසලබැහැර කිරීමේ වැඩිම ගැටළු දක්නට ලැබෙන ස්ථානයයි.

ඇතැම් ස්ථාන වල කුඩා කර්මාන්ත වලට යොදාගන්නා අමුද්‍රව්‍යයන්ගේ අපද්‍රව්‍ය පිළිස්සීමේ ගැටළු මතුවී ඇති අතර මහජන සෞඛ්‍ය පරීක්ෂක හරහා එම ගැටළු කාරී තත්ත්වයන් විසඳා ගැනීමට යොමු වී ඇත. වසමේ ක්ලීන් ශ්‍රීලංකා කමිටුව මගින් මේසඳහා යෝජනා සකස් කරමින් පවතින අතර අපද්‍රව්‍ය වර්ගීකරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමත්, ප්‍රාදේශිය සභාව සම්බන්ධ කරගනිමින් මාස දෙකකට වරක් හෝ කසල පොළ පැවැත්වීම සම්බන්ධව කටයුතු සාකච්ඡා කරමින් පවතී.

ii)සාම්ප්‍රදායික පරිසර දැනුම හා පරිචාර

a) ජනප්‍රවාද / ජනශෘතිය

මාගම්මන ගම්මානයේ අතීත කථාව Vi වන පරාක්‍රමබාහු රජ කාලය දක්නා දිවයයි.

VI වන පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේදී උලකුඩය දේවියට යාග හෝම කිරීම සඳහා ඉන්දියාවෙන් ගෙන්වනු ලැබූ බ්‍රාහ්මණයින් පදිංචි කරවූයේ අසල පිහිටා ඇති බ්‍රාහ්මණගම නැමති ගම්මානයෙයි. බ්‍රාහ්මණගම සිට යාග හෝම කිරීම සඳහා හෝමාගමට යන එන බ්‍රාහ්මණයින් එම ගමන් මාර්ගයේ ඇති සරුසාර බිම් ප්‍රෙද්ශයක් දැක එහි කැලෑ එළි පෙහෙළි කොට විවිධ වගාවන් සිදුකර එම ප්‍රෙද්ශය ජනාවාස සහිත බිමක් බවට පත් කළහ. අවට ගම්මාන රුසක් හා බැඳීගිය කථාන්තරයක කොටසක් වෙමින් මෙම ජනාවාසය මහාගම්මානයක් බවට පත්විය. පසුව එම මහා ගම්මානය මාගම්මන ලෙස ව්‍යවහාරයට එක් වූ බව ජනවහරේ සඳහන් වේ.

1989 වසරේදී ග්‍රාම නිලධාරි සීමා නිර්ණය කිරීමේදී පරිපාලනයේ පහසුව සඳහා මාගම්මන නැගෙනහිර /බටහිර ලෙස ග්‍රාම නිලධාරි වසම් දෙකක් ලෙස වෙන් කර ඇත.

c)දේශීය වෛද්‍ය ක්‍රම

පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම හෝ වෛද්‍යවරු වසම තුළ නැත.

iii)සාම්ප්‍රදායික ජන කණ්ඩායම් හා පරිසර අභිචරණ

වසම තුළ දක්නට නොලැබේ.

iv)පරිසර ගැටළු සඳහා යෙදුනු විසඳුම් /විකල්ප

මෙම වසමේ ප්‍රධාන පරිසර ගැටළුව ලෙස හඳුනාගත හැක්කේ ඇතැම් ස්ථාන වල අවිධිමත් කැළිකසල බැහැර කිරීමයි. මේ සඳහා පහත විසඳුම් යෝජනා කරමි.

- මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයා හරහා ප්‍රජාව දැනුවත් කිරීම
- කසල කළමණාකරනය පිළිබඳ දැනුවත් කිරීම
- කසල පොළ වැඩසටහන පැවැත්වීම

06.කාලීන පාරිසරික අර්බුධ හා අභියෝග

i) වන විනාශය /කැළෑ එළිකිරීම - වසමට අදාල නොවේ

ii) ජල හිඟය - වසමට අදාල නොවේ

iii) පාංශු හායනය - වසම තුළ වාර්තා වී නොමැත.

iv)කැලිකසළ බැහැර කිරීම්

විශාල වශයෙන් නොවුනද මාර්ග දෙපස කැලිකසළ බැහැර කිරීම් යම් ප්‍රමාණයක් වසම තුළ දක්නට ලැබෙයි. ඒ සඳහා විසඳුම් යෝජනා කර ඇත. නිවෙස්වල එකතුවන ප්ලාසිටික් ,පොලිතින් ආදී නොදිරන ද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව හා එක්ව කසල පොළක් පවත්වා ඉවත් කිරීමට යෝජනා කර ඇත.

v)දේශගුණික විපර්යාස වල බලපෑම්

මෙම වසම තුළ දේශගුණික විපර්යාස වලින් දැඩි බලපෑමක් සිදුනොවන වසමකි . ඉතාමත් දැඩි නියං කාලයකදී හැරුණු කොට වගා බිම් සඳහාද පුද්ගල පරිභෝජනය සඳහාද ජල පහසුකම හිමිවේ.

vi)ආගන්තුක හා ආගන්තුක-ආක්‍රමණශීලී විශේෂ වල බලපෑම.

මෙම වසම තුළ වාර්ථාවී නොමැත

07. පාරිසරික තිරසර සංවර්ධන අභිමතාර්ථ සපථ කර ගැනීම.

i. අභිමතාර්ථ අංක 6 -

පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂාව

පිරිසිදු පානීය ජලය යනු ලෝකය පුරා ජීවත්වන සෑම මිනිසෙකුගේම මූලික අවශ්‍යතාවයකි. පිරිසිදු පානීය ජලය උදෙසා සෑම පුද්ගලයෙකුම අයිතිවාසිකම පෑම මෙන්ම ජලය සුරැකීමද අත්‍යවශ්‍ය කාරණයකි. මෙම වසම භූගත ජල සම්පත ට උරුමකම් කියන වසමකි.ඒහෙත් මේ වන විට පානය සඳහා ළිං ජලය භාවිතය අවම වෙමින් ශීඝ්‍රයෙන් නළ ජලය වෙත යොමුවීම දක්නට ලැබෙයි. ජල සම්පාදන මණ්ඩලය මගින් 2024 වර්ෂයේ අවසානය වන විට වසමේ මුළු ගෘහ ඒ්කක වලින් 58% ක ගෘහ ඒ්කක සංඛ්‍යාවක් ජල සැපයුම් සම්භන්ධතාවය ලබාගෙන ඇති අතර ප්‍රජා ජල ව්‍යාපෘතිය හරහා 15% සංඛ්‍යාවක් ජල සැපයුම ලබාගනී. මෙම ජලයේ pH අගය 6.5 ත් 7.5 අතර පවතින බවත් එය පුද්ගල පරිභෝජනය සඳහා සුදුසු අගයක් බවත් මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයා පවසයි.

කෙසේ වෙතත් ප්‍රමාණවත් පිරිසිදු ජලය භාවිතයට වසමේ ජනගහනයෙන් 90% පමණ හිමිකම් කීවද සීමිත පවුල් කිහිපයක් ළිං ජලය භාවිතයේ ගැටළු හේතුවෙන් පීඩා විදියි. ජලය භාවිතය පුද්ගල ජීවිතයේ ප්‍රධානම අංගයක් වුවද එය සුරකීම සම්භන්ධව ජනතාව තුළ ඇත්තේ අවම සැලකිල්ලකි . ඒ් හේතුවෙන්

- භූගත ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය.
- අරපරිස්සම් සහගතව ජලය භාවිතා කිරීමේ වැදගත්කම.
- වගා බිම් සඳහා නවීන තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම.
- පාසල් දරුවන්ට පිරිසිදු ජලය භාවිතයේ හා ජල සම්පත ආරක්ෂා කිරීමේ වැදගත්කම දැනුවත් කිරීම.

ආදී දැනුවත් කිරීම් මෙම අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා වසම තුළ ක්‍රියාත්මක කළ යුතුව ඇත. මෙම වසම තුළ සනීපාරක්ෂාව සම්භන්ධයෙන් සලකා බලන විට 2024 සම්පත් පැතිකඩට අනුව වසමේ ජනගහනයෙන් 91% ක් ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් වලට හිමිකම් කියනු ලබයි. පුද්ගල සනීපාරක්ෂාව හා එහි තිරසර භාවයේ වැදගත් කම සම්බන්ධව තවදුරටත් පාසල් දරුවන් මහජන කණ්ඩායම් දැනුවත් කිරීම සිදුකළ යුතුව ඇත.

ii. අභිමතාර්ථ අංක 07-

ධරණීය හා සුනිත්‍ය බලශක්තිය

ශ්‍රීලංකාව තුළ වැඩි ප්‍රමාණයක් භාවිතා කරනු ලබන බලශක්තිය වන්නේ විදුලිබලයයි. එම විදුලි අවශ්‍යතාවන්ගෙන් 63% විදුලිය ජනනය කරනු ලබන්නේ ඉන්ධන හා ගල් අඟුරු සහ තාප බලාගාර මගිනි. මෙය ඉතා ඉහල පිරිවැයක් දැරිය යුතුවන බල ශක්ති ප්‍රභවයකි. රට තුළ ඇතිවී ඇති මූල්‍ය අර්බුධ හේතුවෙන් අනාගතයේදී ඇතිවිය හැකි බලශක්ති අර්බුධ වලට සාර්ථකව මුහුණ දීමටනම් පුනර්ජනනීය බලශක්ති කෙරෙහි යොමු වීම වැදගත් වනු ඇත. රජයේ ප්‍රතිපත්තිය අනුව 2030 වන විට මුළු පුනර්ජනනීය බලශක්ති උත්පාදනය 70% දක්වා වර්ධනය කර ගැනීමට යෝජිතය. එසේම අනාගතයේදී නව ගල්අඟුරු බලාගාර ඉදි නොකිරීමටද අපේක්ෂිතය.

මෙම වසම තුළද මේ වන විටත් භාවිතයට ගැනෙන්නේ විදුලිබලයයි.

පුන්ර්ජනනීය බල ශක්ති කෙරෙහි පවතින අවධානය අවම මට්ටමක පවතී. වසම තුළ ස්ථාපිත සූර්ය පැනල සංඛ්‍යාව 05 කි. මේ සම්බන්ධව පුද්ගල දැනුවත් භාවය ඇති නමුත් ඒ් සඳහා වැය වන මූලික පිරිවැය අධික වීම , තාක්ෂණික ගැටළු ආදිය නිසාවෙන් යම් පසුබෑමක් ඇතිවී තිබේ.

එසේම බයෝ ගෑස් නිෂ්පාදනයට යම් පිරිසක් හෝ යොමු කරවීමට හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමත් කාලෝචිත වේ. පුනර්ජනනීය බලශක්තිය මගින්

iii. අභිමතාර්ථ අංක 12 -
තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවන්

මෙහිදී නිශ්පාදනයේදී හා පරිභෝජනයේ දී පරිසරය ආරක්ෂා කරගනිමින් ස්වභාවික සම්පත් තිරසරව කළමණාකරණය කරගනිමින් ආර්ථික සංවර්ධනයත් සමාජ සුබසාධනයත් ළඟා කර ගැනීම අපේක්ෂා කරනු ලබයි. විශේෂයෙන්ම පරිසර හිතකාමී නිශ්පාදන ක්‍රමවේද තුළින් නිශ්පාදක පාරිභෝගික දෙපාර්ශවයටම එකසේ ප්‍රතිලාභ ලැබෙනු ඇත. විශේෂයෙන්ම එමගින් සම්පත් ඉතිරියත් කාර්යක්ෂම භාවය මඟින් ඵලදායීතාවය ඉහල යාම හේතුවෙන් භාණ්ඩ හා සේවාවන්ගේ ගුණාත්මක භාවය වැඩිවීමත් සිදුවේ.
සමාජයේ සියළු තාරාතිරම්වල පුද්ගලයින්ගේ මූලික අවශ්‍යතාවයන් ඉටුකර ගනිමින් පරිසරයට සිදුවන අහිතකර බලපෑම අවම කර ගනිමින් තිරසර සංවර්ධනය කරා ගමන් කිරීම අභියෝගයක්ව පවතී.
මෙහිදී ග්‍රාම නිලධාරි වසමක් ලෙස වසමේ පවතින සම්පත් හා නිශ්පාදන අවශ්‍යතා සහ පුද්ගල පාරිභෝජන රටාවන් හඳුනාගෙන ඒසඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමත් සිදුකළ යුතුව ඇත.

iv. අභිමතාර්ථ අංක 13-
දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්

දේශගුණික විපර්යාස යනු යම් භූගෝලීය ප්‍රදේශයක දීර්ඝකාලයක් තිස්සේ පවතින උශ්ණත්වය ,වර්ෂාපතනය ,සුළඟ, ආර්ද්‍රතාවය වැනි කාළගුණික අංගයන්ගේ සාමාන්‍ය තත්ත්වයන් වෙනස්වීමයි.ලෝක ඉතිහාසය තුළ දේශගුණික විපර්යාස නොකඩවා සිදුවුවද අද අප අත් දකින මෙම දේශගුණික විපර්යාස වලට වගකිව යුත්තේ ප්‍රධාන වශයෙන්ම මිනිසායි. මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන මෙම ස්වභාවික ව්‍යසනයන් ඉදිරියේදී මනුශ්‍ය වර්ගයාට ඉමහත් බලපෑමක් සිදුකරනු ඇත. වන විනාශයත් සමග වන වැස්මේ අවම වීම හේතුවෙන් ගෝලීය උශ්ණත්වය වැඩිවීම හේතුවෙන් ගෝලීය වශයෙන් ඇතිවන බලපෑම් ලෙස

- ග්ලැසියර දියවීම නිසා කුඩා දූපත් යට වීමේ අවධානම.
- සාගර ජලයේ උශ්ණත්වය වැඩිවීම නිසා සාගර ජීවීන් විනාශ වීම.
- මෝසම් සුළං රටාවන් වෙනස්වීම නිසා නියමිත කාලයට වැසි නොලැබී යාම හේතුවෙන් දිගුකාලීන නියං තත්ත්වයන් ඇතිවීම
- සුළි සුළං නියඟය, කුණාටු , නාය යෑම් වැනි ස්වභාවික ආපදා වැඩිවීම
- දේශගුණික විපර්යාස නිසා වර්ෂාපතන රටාවේ වෙනස්කම් හේතුවෙන් බෝවන රෝග ව්‍යාප්තිය ඉහහල යාම.
- වර්ෂාපතන රටාවන් ගේ වෙනස්වීම් නිසා කෘෂිකර්මාන්තයට සිධුවන බලපෑම් හේතුවෙන් ආහාර හිඟයක් නිර්මාණය වීම.

යන කරුණු දැක්විය හැකි වේ.
අප වසම තුළද දේශගුණික විපර්යාස හේතුවෙන් සිදුවන බලපෑම් අතර

- උශ්ණත්වය ඉහල යාම
- වර්ෂාපතන රටාවන් වෙනස්වීම හේතුවෙන් කෘෂිකර්මාන්තයට බාදා ඇතිවීම

v. අභිමතාර්ථ අංක 14-
සාගර සම්පත් සංරක්ෂණය හා පිරිමැසුම්දායක භාවිතාව

වසමට අදාල නැත

vi. අභිමතාරථ අංක 15 -
භෞම පරිසර පද්ධතීන් හා සංරක්ෂණය හා තිරසර භාවිතාව

පෘතුවි ග්‍රහයාගේ අභ්‍යන්තරයත්, මතුපිටත් , වායුගෝලය තුළ ඇති සියළුම ජීවි අජීවි සියල්ල හෞම පද්ධතිය ලෙස දක්වනු ලබයි.
අනාගත පරපුර උදෙසා අප අයත් පරිසර පද්ධතිය සුරැකීම මෙන්ම සංරක්ෂණය අත්‍යවශ්‍ය කරුණකි.

- ❖ වසමේ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම උදෙසා ජනතාව දැනුවත් කිරීම.
- ❖ සත්ත්ව කොට්ඨාස වල වාසස්ථාන සුරුකීම
- ❖ පරිසර හිතකාමී ශාක වර්ග නිදහස් අවකාශ සහිත බිම්වල රෝපණය
- ❖ ජල සම්පත සුරැකීම
- ❖ වායු දූෂණය අවමකිරීම

ආදී කරුණු පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමත් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීමත් තිරසර සංවර්ධනයේ වැදගත් සංධිස්ථානයකි.

8. තිරසර පරිසර සංවර්ධනය හා පරිසර කළමණාකරණ යාන්ත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා නව අදහස් , යෝජනා හා නිර්දේශ

තිරසර සංර්ධනයක් කරා ගමන් කිරීමේදී රජය ,පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන, මහජනතාව ආදී සියළු දෙනාගේ දායකත්වය මෙන්ම කැපවීමද අත්‍යවශ්‍ය වේ. 2030 වන විට තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීමට රාජ්‍ය යාන්ත්‍රනය සතු සංවර්ධන ඉලක්ක ඉහත සඳහන් කළ සියළු අංශයන්හි එකමුතුවෙන් සැලසුම් සකස්කර ක්‍රියාතමක කිරීම වඩාත් සර්ථක වනු ඇත.
මෙම ග්‍රාම නිලධාරි වසමට අදාලව සාකච්ඡාකිරීමේදී

- ❖ ප්‍රමුඛතම ගැටළුව ලෙස සැලකෙන කැලිකසළ හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් සකස්කිරීම.ඒ සඳහා කසළ කළමණාකරණ ක්‍රමවේද හඳුන්වා දීම.
- ❖ පරිසර හිතකාමී නිශ්පාදන ප්‍රෙවිශයක් නිශ්පාදන ආයතන සඳහා ලබාදීම. ඒ සඳහා අවශ්‍යවන දැනුවත් කිරීම් හා පුහුණුවීම් නිශ්පාදකයින් සඳහා ලබාදීම.
- ❖ පිරිසිදු ජල භාවිතය උදෙසා ජනතාව දැනුවත් කිරීම මෙන්ම ඒ සඳහා භූගත ජල මූලාශ්‍ර රැක ගැනීමේ අවශ්‍යතාවය පෙන්වා දීම.
- ❖ පුනර්ජනනීය බලශක්තිය කෙරෙහි යොමුවීමේ අවස්ථා වෙනුවෙන් නව ව්‍යාපෘති ඇතිකරවීම හා ඒ සඳහා වන නීතිමය අපහසුතා ඉවත් කිරීම.
- ❖ පරිසර හිතකාමී භාණ්ඩ හා සේවාවන් කෙරෙහි සාමාන්‍ය ජනතාවගේ ඉල්ලුම ඉහල නැංවීම සඳහා වන දැනුවත් කිරීමේ අවස්ථා වැඩිකිරීම.
- ❖ පාරිභෝගිකයාගේ ආරක්ෂාව වෙනුවෙන් භාණ්ඩ නිශ්පාදන ප්‍රමිතිය අඩංගු ද්‍රව්‍ය පිළිබඳ නිශ්පාදකයාගේ වගකිවයුතු සහතික කිරීම සඳහා නිවැරදි තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම.
- ❖ පරිසර දූෂණය සිදුකිරීමට එරෙහිව නීතිමය රාමුවක් සකස්කිරීම හා නීතිය බලාත්මක කිරීම.

ආදී කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු බව යෝජනා කරමි.